අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/08/26/05/08/01 -V

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2020.02. 19

චක්‍රලේඛ අංක 10/2020

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලුම අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්

සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්

සියලුම විදුහල්පතිවරුන්

<u>"ජාතික මට්ටමේ පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ" තරගාවලිය.</u>

2009 වර්ෂයේ දී ජාතික මට්ටමේ එකම නිල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තරගාවලිය ලෙස ආරම්භ කරන ලද "ජාතික මට්ටමේ පාසල් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශූරයෝ" තරගාවලියට අදාළව 2009 වර්ෂයේ දී 2009/19 චක්‍රලේඛය ද 2010 වර්ෂයේ දී 2010/18 චක්‍රලේඛය ද 2011 වර්ෂයේදී 2011/05 චක්‍රලේඛය ද නිකුත් කරන ලද අතර ඉහත තරගාවලිය සම්බන්ධයෙන් මෙතෙක් නිකුත් කර ඇති එම සියලුම චක්‍රලේඛ අවලංගු වන අතර 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂය සඳහා මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වේ.

02. මෙම තරගය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාව මඟින් පවත්වනු ලබන නිල තරගාවලිය වන අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත මණ්ඩලය (FITIS) යටතේ ක්‍රියාත්මක ශ්‍රී ලංකා මෘදුකාංග නිපැයුම්කරුවන්ගේ සංගමය (SLASI) සහ ශ්‍රී ලංකා පරිගණක සමාජය (CSSL) විසින් මෙතෙක් පවත්වනු ලැබූ තරගයන් ද මෙම ප්‍රධාන තරගාවලිය යටතේ පැවැත්වීම මෙහි විශේෂත්වයකි.

03. මෙම තරග සම්බන්ධයෙන් ඒ ඒ කාණ්ඩ සඳහා ක්‍රියාත්මක තරගාවලි පිළිබඳ තේමාවන් කොන්දේසි ඇතුළත් උපදෙස් සංග්‍රහය වාර්ෂිකව නිකුත් කරනු ලැබේ.

04. මෙම තරගාවලිය සඳහා තොරතුරු තාක්ෂණ විෂයය ඉගැන්වීම කටයුතු සිදු කරන සෑම පාසලකින්ම ඉදිරිපත් වීම අනිවාර්යය වන අතර ඒ පිළිබඳ අවශ්‍ය කටයුතු සිදු කිරීම කලාපයේ තොරතුරු තාක්ෂණ විෂයය භාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ගේ වගකීම වේ.

එන්.එච්.එම්. චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

එන්. එච්. එම්. චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" පැලවත්ත,
බත්තරමුල්ල